# 15 වන දවස

## "ඔබගේ රාජ්‍යය පැමිණේවා !"

**"සමිඳාණන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනා කරනු වස් ඔවුන් වහන්සේ මා ආලේප කළ සේක"** (ශු. ලූක් 4:18).

දිළිඳු, අසරණ අය හට ඔවුන් වහන්සේගේ ශුභාරංචිය මහඟු පිටුවහලකි. රෝගීන්, (අබ්බගාතයින්, ලාදුරු රෝගීන්) අන්ධයන් සුව කරති. අශුද්ධාත්මයන් පළවා හරිති. වෛශ්‍යාවන්ට මෙන් ම අයකැමියන්ට ද සමාව දෙති. සියලු වහල් බැමිවලට හසුවී සිටින සමාජයෙන් කොන් වූවන් නිදහස් කරමින්, දෙවි පියාණන්ගේ ශුද්ධ ආදරය අත්දකින්නට සලසන සේක.

මම අනික් පුද්ගලයන්ව නිදහස් කරන කෙනෙක් ද? මගේ මතයේ සිටිමින් මම තමයි හරි (මම නිවැරදියි) යනුවෙන් සිතා වැඩ කරන පුද්ගලයෙක් ද? එසේත් නොමැති නම් මට ඕන දේ ම කරන අනෙක් අයට ඇහුම්කන් නොදෙන ස්වතෘප්තිය, ස්ව ආශාවන්, ස්ව සිතැඟියාවන් පමණක් ඉටුකර ගන්න, දුබලයාට අකමැති, ඔහුව ප්‍රතික්ෂේප කරන කෙනෙකු ද ඔබත් මාත්? එය එසේ නම් අපගේ ජීවිතය තුළ ශුභාරංචියට ඉඩක් නැත. ශුභාරංචිය අප තුළින් දිස් වේ නම් බොහෝ අය, බොහෝ තැන් අප හරහා දේව ආදරය අත්දැකිය යුතු ය. ස්පර්ශ කළ යුතු ය. එසේ නොවේ නම් මනස්ථාපනය වෙමින් ශුභාරංචිය අප තුළින් අන් අයට අත්දකින්නට සලස්වමු.

**යැදුම**

*අබ්බා පියාණෙනි, අපගේ ජීවිත තුළින් ශුභාරංචිය ප්‍රකාශ කිරීමට අපට ඉගැන්වුව මැනව. ඔබවහන්සේගේ ප්‍රේමයෙන් පිරෙමින් ඒ ප්‍රේමයෙන් අන් අයට ප්‍රේම කිරීමට; අපට ශුද්ධාත්මයාණන් වහන්සේගේ මඟපෙන්වීම දානය කළ මැනව.*

**දවස පුරා :-** ✵ **"දිළිඳු වූ ඔබ භාග්‍යවන්ත ය"**
✵ ශු. ලූක් 6:20-26
✵ පුබුදු ගීතාංජලී ගී අංක 208